# මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2020
# Primary Piriven First Term Test - 2020

(03) ත්‍රිපිටක ධර්මය *II*
ශ්‍රේණිය 05

කාලය : පැය 01
Time

I කොටසේ ප්‍ර ශ්නයද II හා III කොටස් වලින් ප්‍රතශ්න දෙක බැගින් ද තොරා ගෙන ප්‍ර'ශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

1 පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න (ලකුණු =2*10 =20)

I. සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤො අඤ්ඤ විසොධයෝ....යන්නෙහි අර්ථය ලියා දක්වන්න.
II. රජගහ නුවර සුකරඛත ලෙනේදී දීඝනඛ නම් පිරිවැජියාට දේශනා කල ධර්මය අසා රහත් වූ හිමියන් කවුරුන්ද?
III. උපසම්පදා භික්ෂුවක් විසින් ආරක්ෂා කල යුතු ආපත්ති ඛන්දක හතක් ඇත .ඉන් තුනක් ලියා දක්වන්න.
IV. නවාංග ශාස්තෘ ශාසනය ලියා දක්වන්න.
V. සතර කර්මක්ලේෂ නම් කරන්න
VI. විකාලවිසිකා චරියානු යෝගෝ යන්නෙන් කියවෙන අර්ථය ලියා දක්වන්න.
VII. රූප පරමාර්ථයේ එන පසාද රූප මොනවාදැයි නම් කරන්න.
VIII. මිහිඳු හිමියන් ලක්දිවට වැඩම කර දෙවන පෑතිස් රජුට දේශනා කල සූත්‍ර.ය කුමක්ද
IX. චක්කවත්ති සීහනාද සූත්‍ර යේ ඉගැන්වෙන සක්විති පාලකයා තුල ඇති විශේෂතා හතරක් ලියන්න.
X. මානයෙහි දක්නට ලැබෙන ප්‍ර භේද තුන ලියා දක්වන්න

## I I කොටස

2 I. බුදුරජාණන් වහන්සේ ගේ තාදී ගුණයේ විශේෂතා හතරක් ලියා දක්වන්න

(ලකුණු 02 යි)

II. "මහා කාරුණිකෝ නාථෝ යන වදනට අනුව බුදුන් වහන්සේගේ කාරුණික බව අගයන්න

(ලකුණු 03 යි)

III. බුදුරජානන් වහන්සේ උත්තරීතර සමාජ දර්ශනිකයානෝ වශයෙන් අර්ථ දක්වා ඇති අයුරු පැහැදිලි කරන්න

(ලකුණු 05 යි)

3 I. යෝ පන භික්ඛු භික්ඛුනං..........යන පාරාජිකා පාඨය ලියා දක්වන්න

(ලකුණු 02 යි)

II. මෛථුන ධම්ම පාරාජිකාවෙන් කියවෙන අර්ථය ලියා දක්වන්න.

(ලකුණු 03 යි)

III. ඉහත පාරාජිකා පන්තියෙහි නිධානය ලියන්න

(ලකුණු 05 යි)

IIIකොටස

4 I. සැරියුත් මහ තෙරුන් වහන්සේට හිමි වූ තනතුරු මොනවාදැයි ලියන්න.

(ලකුණු 02 යි)

II. සැරියුත් හිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ලියා දක්වන්න

(ලකුණු 03 යි)

III. මුගලන් මහරහතන් වහන්සේගේ උදාරතර ශාසනික සේවය ඇගයීමක් කරන්න.

(ලකුණු 05 යි)

.

5 I. සූත්‍ර පිටකය බෙදී ගිය නිකායන් පහ ලියා දක්වන්න

(ලකුණු 02 යි)

II. භෝග විනාශ මුඛ මොනවාදැයි වෙන වෙනම නම් කරන්න.

(ලකුණු 03 යි)

III. නිසි ලෙස කාමභෝගී ගිහි ජීවිතයක් සාර්ථක කර ගැනීම සඳහා සිඟාලෝවාද සූත්‍රදයේ යුතුකම් වගකීම් ඉවහල් කර ගත හැකි අයුරු පෙන්වා දෙන්න.

(ලකුණු 05 යි)

6 I. යො වෙ ගාථාසතං භසේ................

යෝ සහස්සං සහස්සෙන ............. යන ගාථා සම්පූර්ණ කරන්න.

(ලකුණු 02 යි)

II. ඉහත ගාථා වලින් කියවෙන අර්ථ ලියා දක්වන්න

(ලකුණු 03 යි)

III. ධම්ම පදයෙන් අපේ දිවියට ගත හැකි ආදර්ශ සහස්ස වග්ගය ඇසුරින් විස්තර කරන්න .

(ලකුණු 05 යි)

7 I. සතර පරමාර්ථ නම් කරන්න.

(ලකුණු 02 යි)

II. අනිෂ්පන්න රූප දහය අතුරින් තුනක් නම් කරන්න

(ලකුණු 03 යි)

III. අභිධර්ම විග්‍රිහයට අනුව රූපයේ ස්වභාවය හඳුනාගන්නේ කෙසේද යන වග පිළිබඳ විස්තරයක් කරන්න.

(ලකුණු 05 යි)